# රකිමු සිල්පද දිනන්නට ලොව...



A.M. මලිති හිරන්යා අලහකෝන්

# රකිමු සිල්පද දිනන්නට ලොව

A.M. මලිති හිරන්යා අලහකෝන්

සියලුම හිමිකම් ඇවිරිණි

කතෘගේ වෙනත් කෘති

කිරීට පාඩමක් - 2021

කෘතිය පළ කරන දිනය

2025 පෙබරවාරි 08

ISBN 978-624-208-512-8

**පිදුම....**

මෙම කෘතිය...

ගුණ දම් කියා දෙමින්....

හැමදාම ආදරයෙන් මා රැක බලා ගත්...

මගේ ආදරණීය අප්පච්චිට හා අම්මාට...

සෙනෙහසින් පුදන්නෙමි....

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදි කතෘ කරන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිළිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන

ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## රකිමු සිල්පද දිනන්නට ලොව...

කුස්සියෙන් නැඟුණු වළං පිඟන් ගැටෙන හඬත් සමඟ මම එකවරම අවදි උනෙමි. මා අවදි වීමටත් පැය එක හමාරකට පමණ පෙර අම්මා අවදි වූ බව ඒ හඬින් දැන ගත හැකිය.

මීට අවුරුදු දෙකකට පමණ පෙර ගසකින් ඇද වැටී තාත්තා මිය යන විට මා හට යාන්තම් දාහතරක් සහ නංගීට අවුරුදු දහයක් වුණා පමණි. එදා සිට අපව ජීවත් කිරීමට අම්මා නොගත් උත්සාහයක් නොමැත. විවිධ රැකියාවන් සොයා ගිය ද ඒ එකකටවත් ඇය සුදුසු නොවන බව පවසද්දී හැඬූ කඳුළින් ගෙදර එන අම්මා කුස්සියේ පිල් කණ්ඩියට වී කල්පනා කළේ ඊළඟට අපව ජීවත් කරවීමට ඇය කුමක් කරන්නේ දැයි කියාය.

මේ ආකාරයට කල්පනා කිරීමෙන් පලක් නොවන බව තේරුම් ගත් ඇය අවසානයේ දී ගමේ පොහොසත් යැයි සලකනු ලබන නිවෙස්වල බැලමෙහෙවරකම් කිරීමෙන් යමක් උපයා ගැනීම ජීවනෝපාය ලෙස තෝරා ගත්තේ මගේත් නංගීගේත් විරෝධතාවය මැදය. අප දෙදෙනාම එසේ විරුද්ධ වීමට මූලික හේතුව වූයේ අම්මා අනුන්ගේ ගෙවල්වල වළං පිඟන් සේදීම බලා සිටිය නොහැකි වූ නිසාවෙනි.

මෙලෙස දිවා කාලය පුරාම නිවෙස්වල විවිධ වැඩ කටයුතු සිදු කරන අම්මා රාත්‍රිය ළඟාවත්ම නිවසට

පැමිණෙන්නේ අප තිදෙනාටම සෑහෙන්නට රාත්‍රී ආහාරය ද එම නිවෙස්වලින් සපයා ගැනීමෙන් අනතුරුවය.

උදේ කහට කෝප්පයක් බී පාසල් යන නංගීත් මාත් පාසලේ දිවා ආහාරය වෙලාවේ දී ජල කරාමය අසළට ගොස් කුස පිරෙන්නට වතුර බීම පුරුද්දක් කර ගෙන සිටි බව පාසලේ ළමුන් සියල්ලන්ටම අමුත්තක් නොවේ. කාලය මෙසේ ගෙවී යත්ම නංගීත් මාත් වැඩිවියට පැමිණීමත් සමඟ අප දෙදෙනාගේ වුවමනා එපාකම් ක්‍රමයෙන් වැඩි වූ අතර, පාසලේ වියදම් ද එකිනෙක වැඩි වන්නට විය. මෙයට විවිධ විසඳුම් ක්‍රම කල්පනා කළ නමුත්, අවසානයේදී මා අම්මා සමඟ කීව්වේ නංගී පාසල් යවා මා නිවසේ නතර වී කුමක් හෝ රැකියාවක් කර ගෙදරට මුදලක් උපයා ගැනීමට තීරණය කළ බවයි.

"උඹට පිස්සුද මයෙ පුතේ, මගේ පණ තියෙන කල් උඹලා දෙන්නට කාගෙවත් බැල මෙහෙවරකම් කරන්න දෙන්නෙ නෑ. තාත්තගෙ ඇස් දෙක පියවෙන වෙලාවෙත් උන්දෑ කිව්වේ කොහොමහරි උඹල දෙන්නට උගන්වන්න කියලා. මම මොන දුකක් විඳලා හරි උන්දැගෙ ඒ ආශාව ඉෂ්ඨ කරනවා. උන්දෑ කොහේ හරි ඉඳලා අපි තුන්දෙනා දිහා බලාගෙන ඉන්නවා. මට ඒක විශ්වාසයි. උඹ හැමදාම ඉස්කෝලෙ පලයං. මට

පුළුවන් විදිහට උඹලව ජීවත් කරවන්නම්.'' එසේ කිවූ අම්මා කුස්සියේ දොරෙන් එළියට යන ගමන් හැට්ට කරෙන් ඇස් දෙකට ඉණු කඳුළු පිසදාන අයුරු මම දුටුවෙමි.

කෙසේ හෝ ඉගෙන ගෙන ලොකු නෝනා කෙනෙක් වී අම්මාත් නංගීත් හොඳින් රැක බලා ගන්නා බවට මම එදා තරයේ සිතා ගත්තෙමි.

ඉන් දින කීපයකට පසු ගෙදර වියදම් සරිකර ගැනීම සඳහා පාලම ළඟ පියදාස මාමාගේ කඩයට ඉඳි ආප්ප සහ පිට්ටු සාදා දැමීමට තීරණය කළ බව අම්මා මා සමඟ පැවසුවාය.

ඇයට උදව්වක් ලෙස එතැන් සිට සෑම දවසකම මාත් නංගීත් අම්මා උදෑසනම අවදි වී ඉඳි ආප්ප සහ පිට්ටු බෙසම් දෙක ගුරු පාර දිගේ රැගෙන ගොස් පියදාස මාමාගේ කඩයට දී නැවත පාසල් යාම පුරුද්දක් කර ගත්තෙමු.

"ලොකු පුතේ නංගිත් එක්ක නැගිටින්න මයෙ අම්මා. නැත්නම් ඉස්කෝලෙ යන්න පරක්කු වෙයි.'' අම්මා එසේ කියනවාත් සමඟම සිහිවිලි දාමයකින් මිදුණු මම පැදුරේ අනෙක් පස නිදා සිටි නංගී ද අවදි කර පාසල් යාමට සූදානම් වුණෙමි.

ඒ වන විටත් අම්මා ඉඳි ආප්ප සහ පිට්ටු සාදා බේසම් දෙකකට අසුරා අවහර වී තිබුණි.

“උඹලා දෙන්නට කාලා යන්නත් මම පිට්ටු කෑලි දෙකක් පිඟන් දෙකකට බෙදුවා. කාලම යන්න මයෙ පුතේ. මම ලොකු නෝනලාගේ ගෙදර යනවා. දැනටමත් පරක්කු වැඩියි.”

එසේ කිවූ අම්මා කුස්සියේ වැඩ කිරීමට අඳින පරණ චීත්තයද කඩදාසි කොළයක ඔතාගෙන මිදුලට බැස්සාය. නංගීත් මාත් දුවගෙන විත් අම්මාට වැන්දේ ඇය නැවත නිවසට එන්නේ අප දෙදෙනා පාසල ඇරී නිවසට ආවායින්ද පසුව බව හොඳාකාරවම දන්නා නිසාවෙනි.

අම්මා නිවසින් පිටවූ පසු පැදුර අකුලා දැමූ නංගීත් මාත් ළිඳෙන්



වතුර බාල්දි දෙකක් ඇද මුහුණ සෝදා ගත්තෙමු. දත් මැදීම සඳහා පුරුදු පරිදි අඟුරු කැබැල්ලක් ගලගා මට ද

කොටසක් ලබා දීම නංගී වෙනදා මෙන් අදත් සිදු කළාය.

ඊයේ සවස සෝදා දැමූ සුදු ගවුම් දෙකේ තාම තෙත ඇරී නැත. මුළු රාත්‍රිය පුරාම ඇද හැළුණු ධාරානිපාත වර්ෂාව ඊට හේතු විය. අන් ළමයින්ට මෙන් අපට මාරු කර ඇඳීමට ගවුම් දෙක තුනක් තිබුණේ නැත. තිබුණු එකම ගවුම දිනපතාම සෝදා ඇඳීම අපි දෙදෙනාගේ පුරුද්ද විය. මාත් නංගීත් ගවුම් දෙක ගසා දමා ඇඳ ගත්තේ තවත් වේලා ගත කළ හොත් පාසල් යාමට පරක්කු වෙන නිසාවෙනි.



අම්මා උදෑසනම ගෙදරින් පිටත් වීමට පෙර බෙලෙක් පිඟන් දෙකකට බෙදා තිබුණු පිට්ටු කෑලි දෙක හනි හනික ගිල දැමූ මාත් නංගීත් ඉඳි ආප්ප හා පිට්ටු බෙසම් දෙක ද රැගෙන නිවසින් එළියට බැස්සේ

තවදුරටත් රැඳී සිටියහොත් ඉඳි ආප්ප සහ පිට්ටු කඩයට දැමීමෙන් පලක් නොවන බැවිනි. ඒ වන විටත් උදෑසන හයයි තිහ පසුවී තිබුණාට සැක නැත.

"අදත් පරක්කුයි ළමයිනේ, උඹලාගේ අම්මාට කියාපල්ලාකෝ තව ටිකක් කලියෙන් ඇහැරලා කඩයප්පන් ටික වේලාසනින් කඩයට දාන්න කියලා." මේ පියදාස මාමාගෙන් පරක්කු උවහොත් අසන්නට ලැබෙන සුපුරුදු කතා විලාශයයි. අඩිය ඉක්මන් කර ගියහොත් හත වන විටවත් කඩය ළඟට යා හැකිය.

මාත් නංගීත් හැමදාම යන පාර අද හොඳ හැටි මඩවී පාර පුරා වතුර වළවල් සෑදී ඇත්තේ ඊයේ රාත්‍රිය පුරාවට ඇද හැළුණු ධාරානිපාත වර්ෂාවේ තරම කියාපාන්නට මෙනි.

කකුලේ තිබුණු සෙරප්පු ජෝඩුව ගලවා අප දෙදෙනාම අතට ගත්තේ තවදුරටත් එය පයේලාගෙන ගියහොත් ගවුම පුරා මඩ වතුර ඉසී ගවුම මඩ පාට වනු වළක්වා ගැනීම සඳහාය.

අප පසු කර පාසලට යනෙන අනෙක් ළමුන් සුදුපාට සපත්තු පැළැඳගෙන යන දර්ශනය අප දෙදෙනාට අමුත්තක් නොවේ.



නමුත් කිසි විටෙකත් සෙරප්පු වෙනුවට සපත්තු ඉල්ලා නංගී හෝ මා අම්මාට කරදර කර නොමැත. ඊට හේතුව ඇයට ඒ ඉල්ලීම ඉටු කිරීමට කිසිදු හැකියාවක් නොමැති බව අප දෙදෙනාම දන්නා බැවිනි.

මඩ වළවල් පිරුණු පාර දිගේ හෙමි හෙමින් ඇවිද යන අප දෙදෙනා පාරේ යනෙන බයිසිකලයකින් හෝ වෙනත් වාහනයකින් ඉසගෙන යන මඩ වතුරින් නැහැවී ගිය වාරද නොතිබුණාම නොවේ.

"අක්කේ අර කවුද අප්පා. අපි කවදාවත්ම දැකලා නෑනේ. මෙහෙ කෙනෙක් නම් වෙන්න බෑ. බලන්නකෝ ජැන්ඩියට ඇඳලා යන ලස්සන." නංගී එසේ කියන කොට මා ද පාර ඉස්සරහා බෝක්කුව පසු කරමින් යන පුද්ගලයා දෙස බැලුවෙමි. "ඇත්තටම එයා නම් මේ ගමේ කෙනෙක් නෙවෙයි. ඔයා හරි." මම ද නංගීට කිව්වෙමි.

එම පුද්ගලයා අපට ඉදිරියෙන් වේගයෙන් පාර දිගේ ගමන් කළ අතර, අප දෙදෙනා ද හෙමි හෙමින් කෑම බේසම් දෙක ද රැගෙන පාර දිගේ ඉදිරියට ගමන් කළෙමු.

"අක්කේ මේ මොකක් ද? පිරිමි කෙනෙකුගේ පර්ස් එකක් වගේ නේ ද? එසේ කියා තරමක් හයියෙන් කෑ ගැසූ නංගී පාරේ වැටී තිබූ ලා දුඹුරු පාටට හුරු පිරිමි අයෙකුට අයිති විය හැකියි සැක කළ හැකි



මුදල් පසුම්බියක් අහුලා ගත්තාය. කෑම බේසම් දෙක අසළ තිබුණු ගලක් උඩ තැබූ නංගීත් මාත් එය විවෘත කර බැලීමට සූදානම් වීමු.

එය විවෘත කර බැලූ අප දෙදෙනාට ඒ තුළ ජාතික හැඳුනුම්පතක්, තවත් විවිධ වර්ගයේ කාඩ්පත් රාශියක්

සහ විශාල ප්‍රමාණයේ සල්ලි මිටියක් ද දක්නට ලැබිණ. "මේකට මොකද කරන්නේ." මම නංගීගෙන් ඇසුවෙමි.

"අපි දෙන්නා මේක අරගෙන ගිහිං ඔයාලගෙ ටීචට දෙමු." නංගි කිව්වාය. "ඔව් ඒක හොඳයි. එහෙම කරමු." එසේ තීරණය කළ මාත් නංගීත් කඩයප්පම් බේසම් දෙකද පියදාස මාමාගේ කඩයට දී හැකි ඉක්මනින් පාසල දෙසට පියමං කළෙමු.

උදෑසන පාසල් රැස්වීම අවසාන වීමත් සමඟ මාත් නංගීත් අහුලාගත් මුදල් පසුම්බිය ද රැගෙන අපේ පන්තිය අසල ඇති අඹ ගස දෙසට ගමන් කළේ අපේ පන්තිභාර ගුරුතුමිය හමුවීමේ බලාපොරොත්තුවෙනි.

ටික වේලාවක් එසේ සිටි අපි දෙදෙනාට ඈතින් කුසුමලතා ටීච පැමිණෙන අයුරු දක්නට ලැබුණි.

"මොකද කාංචනා ඔතන කරන්නේ පන්තියට යන්නේ නැද්ද? දැන් ඉස්කෝලේ පටන් අරගෙන ඉවරයි." එසේ අසමින් ගුරුතුමිය අප අසළට පැමිණියාය.



උද්‍යැසන වූ සිදුවීම මුල සිට අකුරක් නෑරම කුසුමලතා ටීචට පැවසූ නංගීත් මාත් අත තිබූ මුදල් පසුම්බිය ගුරුතුමියගේ අතට ලබා දුන්නෙමු. "ඔය දෙන්නා කරලා තියෙන්නේ ඉතාම හොඳ වැඩක්. මම මේ පර්ස් එක දැන්මම ලොකු සර්ට දෙන්නම්." කියා අප දෙදෙනාගේම හිස අතගා ඇය විදුහල්පති තුමාගේ කාර්යාලය දෙසට පියමං කළාය.

අපි දෙදෙනා ද වෙන් වෙන් වශයෙන් අපගේ පන්ති කාමර දෙසට ගමන් කළෙමු.

පාසල නිමවී නිවසට ගිය මාත් නංගීත් අම්මා එනතුරු බලා සිටියේ ඉතා නොඉවසිල්ලෙනි. ඒ අන් කිසිවක් නිසා නොව උද්‍යැසන වූ සිද්ධිය අම්මාට විස්තර කිරීමට තිබූ ආශාව නිසාවෙනි.

අප දෙදෙනා කිවූ විස්තරය අම්මා අසා සිටියේ ඇස් ලොකු කර ගෙන පුදුමයෙන් මෙනි. "මයෙ කෙල්ලෝ දෙන්නා කරලා තියෙන්නේ හොඳම හොඳ වැඩක්. අපිට කාගෙවත් සල්ලි ඕනෙ නෑ. අපි තියෙන විදිහකට ජීවත් වෙමු." එසේ පැවසූ අම්මා අප දෙදෙනාගේ හිස අතගා කුස්සිය දෙසට පියමං කළාය.

ඒ සිද්ධියෙන් පසු සති කිහිපයක් සුපුරුදු පරිදි කාලය ගෙවී ගිය අතර, අප දෙදෙනා ද වෙනදා දින චර්යාවට අනුව පාසල් යෑම හා පියදාස මාමාගේ කඩයට ඉඳි ආප්ප හා පිට්ටු රැගෙන යාම සිදු කරන ලදී.

එක් උදෑසනක පාසල් රැස්වීමෙන් අනතුරුව මගේ පන්තිකාමරයට පැමිණි විදුහල්පති තුමා “කාංචනා අද පාසල් ඇවිත් ඉන්නවා ද?” යැයි කුසුමලතා ටීචගෙන් විමසුවේය.




ඒත් සමඟම නැගී සිටි මා විදුහල්පති තුමා දෙස බැලුවෙමි. “හෙට අම්මාත් නංගීත් එක්ක උදේ දහය හමාර විතර වෙනකොට ඉස්කෝලෙට එන්න.” එසේ කිවූ විදුහල්පති තුමා පන්ති කාමරයෙන් පිටව ගියේය.

පාසල නිමවී නිවසට ගිය මා ගෙදර ආ විගසට ලොකු සර් කිවූ කාරණය අම්මාට පැහැදිළි කළ අතර, හේතුව කුමක්දැයි අප තිදෙනාම කල්පනා කරන්නට පටන් ගත්තෙමු.

පසුදා එළිවූ විගසම අම්මාද ඇයට තිබුණු එකම සාරියෙන් සැරසී  අපත් සමඟ පාසල් යාමට පිටත් වූවාය. විදුහල්පති තුමා පාසලට පැමිණෙන තුරු රැඳී සිටි අප තිදෙනා එතුමා පැමිණි විගසම කාර්යාලය තුළට ඇතුළු වූයේ දැඩි කුතුහලයකින් යුතුවය.

ඉතාම සුහදශීලීව සිනාමුසු මුහුණින් අපව පිළිගත් විදුහල්පති තුමා “මේ කාංචනාගේ අම්මා වෙන්න ඇති. එන්න එන්න ඇතුළට. මෙතැනින් වාඩි වෙන්නකෝ” කියමින් අම්මාට එතුමාගේ මේසය අසළ තිබුණු ලී පුටුවක් දෙසට අත දිගු කළේය. “ඕනෙ නෑ මහත්තයෝ මෙහෙම හොඳා.” එසේ පැවසූ අම්මා විදුහල්පති තුමාගේ මේසය ළඟින් තවදුරටත් ඈත් වූවාය.

ඒත් සමඟම විදුහල්පති තුමාගේ කාමරයට ඇතළු වූයේ වයස අවුරුදු හතළිහක් පණහක් පමණ පෙනුමක් සහිත ප්‍රියමනාප මහත්මයෙකි. “එන්න එන්න මහත්තයා, ඇතුළට ඇවිත් වාඩි වෙන්න.” විදුහල්පති තුමා එසේ කියනවාත් සමඟම අමුත්තා සිනාමුසු මුහුණින් යුතුව කාර්යාලය තුළට විත් විදුහල්පති තුමා පෙන්වූ සුවපහසු අසුනෙහි වාඩිගත්තේය.

“කාංචනා, මේ මහත්තයා අඳුරනවාද?” විදුහල්පති තුමා මා දෙස බලා එසේ ඇසූ අතර, නැතැයි කීමට මා ඔළුව වැනුවා පමණි. “මේ තමයි එදා ඔයාලා දෙන්නා පාරේ වැටිලා තිබිල අහුලගත්ත මුදල් පසුම්බියේ

අයිතිකාරයා.'' එසේ කිවූ විදුහල්පති තුමා අමුත්තා දෙස ඉතා ගෞරවාන්විත බැල්මක් හෙළුවේය.



ඒ සමඟම ඉඳගෙන සිටි අසුනින් නැඟිටගත් අපේ අම්මා "ඇයි මහත්තයෝ, එකේ මොනවා හරි අඩුවෙලා තබුණාද'' යි ඉතාම බැගෑපත් ලීලාවෙන් ඇසුවාය.

"අනේ නෑ අම්මේ, මේ දරුවෝ දෙන්නා එදා මට කළේ ලොකු උදව්වක්. මට ඒකේ තිබුණ සල්ලිවලට වඩා වටින්නේ ඒකේ තිබුණු වැදගත් ලියකියවිලි ටික. කිසිම දෙයක් අඩු නැතුව විදුහල්පති තුමා මට ඒක බාර දුන්නා. ඔයාලා දෙන්නට බොහොම ස්තූතියි'' එසේ

කිවූ අමුත්තා විදුහල්පති තුමා දෙස සුහදශීලී බැල්මක් හෙලුවේය.

"ඒක නෙවෙයි විදුහල්පති තුමා, මම කැමැතියි මේ දරුවො දෙන්නට ජීවිත කාලයටම වටිනා උදව්වක් කරන්න. මට ඒකට අවස්ථාවක් දෙන්ට පුළුවන් නේද?"

"මගෙන් කිසිම බාධාවක් නෑ. ඔබ තුමා කැමැති දෙයක් කරන්න." විදුහල්පති තුමා එසේ පවසා අප දෙදෙනා දෙස බැලුවේය.

"මේ දරුවෝ දෙන්නා කවදා හරි ඉගෙන ගෙන ඉවර වෙනකල්ම මම කැමැතියි දරුවන්ගේ ඉගෙනීමේ කටයුතුවලට උදව් කරන්න." එසේ කිවූ අමුත්තා විදුහල්පති තුමාගෙන් අප දෙදෙනාගේ සියලු විස්තර ඉල්ලා ගෙන එතුමාගේ දුරකථන අංකය ද විදුහල්පති තුමාට ලබා දීමෙන් අනතුරුව කාර්යාලයෙන් පිටව ගියේය.

ඉන් පසුව විදුහල්පති තුමාට ද ස්තූති කළ අප තිදෙනා  නිවස බලා පිටත් වීමු. කිසිදු කතා බහක් නොමැතිව අපි තිදෙනාම එක පෙළට පාසලේ සිට ඇවිදගෙන විත් ගෙතුළට ඇතුළු වීමු.

"මගේ බරින් බාගයක්ම නිදහස් වුණා." එසේ කිවූ අම්මා සාලයේ තිබූ බූරු ඇඳේ වාඩි වූවාය. "මම උඹලා දෙන්නාට හැමදාම කියනවා වගේ උඹලගේ තාත්තා කොහේ හරි ඉඳලා උඹලා දෙන්නා දිහා බලාගෙන

ඉන්නවා. ඒකයි මේ විදිහට හරි උඹලා දෙන්නාට උදව් ලැබෙන්නේ.'' එසේ පැවසූ අම්මා ''මයෙ කෙල්ලෝ දෙන්නාට දෙයි හාමුදුරුවන්ගෙම පිහිටයි.'' කියා කුස්සිය දෙසට ගමන් කළාය.

මමත් නංගීත් අපි දෙන්නාගේ අනාගතය ගැන අලුත් බලාපොරොත්තු ගොන්නක් හිතින් දරාගෙන එදා රාත්‍රියේ නින්දට ගියෙමු.

නිමි....

# පසුවදන

රටේ අනාග සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්‍ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක.
සෙනෙවිරත්න මහලේකම්